# දකුණු පළාත

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**(අ) පළාත් සභා අරමුදල් ගිණුම**

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2012 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කරන ලදි.

**(ආ) අනෙකුත් ගිණුම්**

සමාලෝචිත වර්ෂයට අදාලව 2012 අප්‍රේල් 30 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

<u>2012 අප්‍රේල් 30 දිනට</u>

| | ගිණුම | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකල ගිණුම් සංඛ්‍යාව | ඉකුත් වර්ෂවලට අදාලව ඉදිරිපත් නොකල ගිණුම් |
|---|---|---|---|---|---|
| (i). | විසර්ජන ගිණුම් | 26 | 25 | 01 | |
| (ii). | ආදායම් ගිණුම් | 01 | 01 | - | |
| (iii). | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 90 | 81 | 09 | |
| (iv). | වාණිජ අත්තිකාරම් ගිණුම් | 11 | 05 | 06 | |
| (v). | අරමුදල් ගිණුම් | 06 | 05 | 01 | 01 |
| (vi). | ප්‍රඥප්ති ගිණුම් | 05 | 03 | 02 | |
| (vii). | වත්කම් බැරකම් ප්‍රකාශ | 01 | 01 | | |
| | | 140 | 121 | 19 | 01 |

### 1.1.2 මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සභා අරමුදල් ගිණුමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 1.2.1 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 08 කට අදාලව අරමුදල් ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 162,560,662 ක් වූ අතර, උපයෝගී වාර්තා අනුව ශේෂයන්ගේ එකතුව රු.167,674,881 ක් විය.

**1.2.2 බැංකු සැසඳුම්**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ආයතන 05 කට අදාලව මාස 06ක කාලයක් ඉක්මවා තිබූ උපලබ්ධි නොවූ තැන්පතු රු.5,011,831 ක් සම්බන්ධයෙන් බැංකුවෙන් විමසා පසු විපරම් කටයුතු කර නොතිබුණි.

(ආ) බැංකු ගිණුම් 05 කට අදාලව හඳුනා නොගත් හර රු.2,802,225 ක් විය.

**1.2.3 ගෙවිය යුතු ගිණුම්**

අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.2,543,543 ක් විය.

**1.2.4 අග්‍රිම ගිණුම්**

2011 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකළ රු.23,948,319 ක් වූ අග්‍රිම හර ශේෂයක් තිබුණි.

**1.2.5 පොදු තැන්පත් ගිණුම්**

මුදල් රෙගුලාසි 571 විධිවිධානය ප්‍රකාරව කටයුතු කළහැකිව තිබුණුද එසේ කටයුතු නොකළ, 2011 දෙසැම්බර් 31 දිනට අවුරුදු 02 ක කාලයක් ඉක්මවා තිබූ පොදු තැන්පත් වල වටිනාකම රු.37,272,209 ක් විය.

**1.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **පිළිතුරු නොලත් විගණන විමසුම්**

2011 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 118 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විගණන විමසුම් 68 ක ගණනය කළහැකි වටිනාකම රු.285,185,740 ක් විය.

(ආ) **තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.296,190,154 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.133,301,763 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.319,770,185 ක් විය.

## 2.2 ආදායම් හා වියදම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| විස්තරය | 2011 | | | | 2010 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | අයවැය ගත | තථ්‍ය | විචලනය | විචලනය ප්‍රතිශතයක් ලෙස | අයවැය ගත | තථ්‍ය | විචලනය | විචලනය ප්‍රතිශතයක් ලෙස |
| | රු. | රු. | රු. | % | රු. | රු. | රු. | % |
| පළාත් සභා විෂයයන්ට අදාල ආදායම් | | | | | | | | |
| බදු ආදායම් | 958,760,000 | 3,704,705,988 | 2,745,945,988 | 286 | 2,680,000,000 | 2,532,157,291 | (147,842,709) | (5.52) |
| බදු නොවන ආදායම් | 935,240,000 | 569,924,269 | (365,315,731) | (39) | 1,030,000,000 | 520,489,536 | (509.510.464) | (49.46) |
| රජයේ ප්‍රදාන | 14,643,250,000 | 13,335,535,508 | (1,307,714,492) | (9) | 13,478,350,000 | 12,485,956,169 | (992,393,831) | (7.36) |
| වෙනත් ආධාර | - | 691,145,821 | 691,145,821 | 100 | - | 743,679,552 | 743,679,552 | 100 |
| | 16,537,250,000 | 18,301,311,586 | 1,764,061,586 | | 17,188,350,000 | 16,282,282,548 | 906,067,452 | |
| පුනරාවර්තන වියදම් | | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 13,346,614,545 | 12,658,911,497 | 687,703,048 | 95 | 10,879,794,000 | 8,196,595,492 | 2,683,198,508 | 24.66 |
| අනෙකුත් | 3,142,629,932 | 3,022,100,616 | 120,529,316 | 96 | 3,366,804,000 | 5,538,840,102 | (2,172,036,102) | (64.51) |
| උප එකතුව | 16,489,244,477 | 15,681,012,113 | 808,232,364 | 95 | 14,246,598,000 | 13,735,435,594 | 511,162,406 | 3.58 |
| ප්‍රාග්ධන වියදම | 2,463,325,599 | 2,120,854,060 | 342,471,539 | 86 | 2,969,459,000 | 2,848,446,045 | 121,012,955 | 4.08 |
| මුළු එකතුව | 18,952,570,076 | 17,801,866,173 | 1,150,703,903 | 94 | 17,216,057,000 | 16,583,881,639 | 632,175,361 | 3.67 |

## 2.3 ආදායම් පරිපාලනය

ඉදිරිපත් කර ඇති ගිණුම් අනුව, පසුගිය වර්ෂ 03 ක එම එක් එක් වර්ෂය අවසානයට හිඟ ආදායම පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට | | | |
|---|---|---|---|---|
| | 2011 වර්ෂය | 2010 වර්ෂය | 2009 වර්ෂය | එකතුව |
| | රු. | රු. | රු. | රු. |
| බදු ආදායම | 379,214,474 | 148,695,113 | 122,870,002 | 650,779,589 |
| බදු නොවන ආදායම | 327,990,122 | 59,436,927 | 267,443,397 | 654,870,446 |
| | 707,204,596 | 208,132,040 | 390,313,399 | 1,305,650,035 |

## 2.4 අත්තිකාරම් ගිණුම්වල සීමාවන් පිළිනොපැදීම

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 503 හා දකුණු පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ රීති 369 හි නියමයන්ට පටහැනිව අත්තිකාරම් ගිණුම් විෂයය අංක 30801 හි හර ශේෂයේ උපරිම සීමාව රු.1,582,950 කින් ඉක්මවා තිබූ අතර, විෂය අංක 31801 හි ලැබීම් වල අවම සීමාව රු.268,955 කින් පහත වැටී තිබුණි.

## 2.5 කාරක පාඩු

වාණිජ අත්තිකාරම් ගිණුම් 05 ක පසුගිය වර්ෂ 04 කදී දිගින් දිගටම කාරක පාඩු වාර්තා වී තිබුණි. දකුණු පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ රීති 379 හි විධිවිධාන අනුව යථෝක්ත කාරක පාඩු ආවරණය කර ගැනීම සඳහා කටයුතු කර නොතිබූ අතර, අත්තිකාරම් ගිණුම් පාඩු පිට පවත්වා ගෙන යාමේ ආර්ථික හා සමාජ සාධාරණත්වය පිළිබඳව කළමණාකාරිත්වය විසින් අවධානය යොමුකර නොතිබුණි.

## 2.6 මානව සම්පත් කළමනාකරණය

### 2.6.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2011 දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ) **පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන**

| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 1,335 | 1,186 | 149 |
| තෘතීය මට්ටම | 1,887 | 1,881 | 06 |
| ද්විතියික මට්ටම | 5,417 | 4,662 | 755 |
| ප්‍රාථමික මට්ටම | 4,011 | 3,346 | 665 |
| එකතුව | 12,650 | 11,075 | 1,575 |

(ආ) **පාසැල් කාර්ය මණ්ඩලය**

| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| විදුහල්පති | 1,301 | 670 | 631 |
| ගුරුභවතුන් | 23,904 | 22,543 | 1,361 |
| වෙනත් | 1,611 | 1,186 | 425 |
| | 26,816 | 24,399 | 2,417 |

(i) තංගල්ල කලාපය තුළ පිහිටි පාසල් 73 ක 2011 දෙසැම්බර් 31 දිනට විෂයයන් 13 ක් වෙනුවෙන් ගුරු ඌණතා 77 ක්ද පාසල් 57 ක විෂයයන් 14 ක් වෙනුවෙන් ගුරු අතිරික්තතා 63 ක් ද තිබුණි.

(ii) වලස්මුල්ල කලාපයට අයත් පාසල්වල 2012 ජනවාරි 24 වන දිනට ලබාගත් තොරතුරු වලට අනුව විදුහල් 43 ක අතිරික්ත ගුරු සංඛ්‍යාව 84 ක් වූ අතර විදුහල් 13 ක ඌණ ගුරු සංඛ්‍යාව 17 ක් විය.

## 2.7 වත්කම් කළමනාකරණය

### 2.7.1 නිෂ්කය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

වත්කම් නිශ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | වත්කම් ස්වභාවය | සංඛ්‍යාව | වටිනාකම | නිෂ්ක්‍රීයව පැවති කාලය (අවුරුදු) |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | ඉඩම් | 02 | 550,000 | 1 - 3 |
| (ආ) | ගොඩනැගිලි | 27 | 15,913,015 | 1 - 6 |
| (ඇ) | යන්ත්‍රෝපකරණ | 1,222 | 4,203,168 | 1 - 8 |
| (ඈ) | වාහන | 19 | - | 2 - 6 |
| (ඉ) | වෙනත් වත්කම් | 43 | 195,000 | 1 - 3 |

### 2.7.2 සමීක්ෂණය නොකළ වත්කම්

මුදල් රෙගුලාසි 756 අනුව හා පළාත් සභා මුදල් රීති 476 ප්‍රකාරව පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 05 ක සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

### 2.7.3 ලැබිය යුතු ගිණුම්

2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.87,894,938ක් වූ අතර අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හී එකතුව රු.60,344,163 ක් විය.

### 2.7.4 අයවීමට ඇති සේවක ණය

2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.685,365,289 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු. 70,142,733 ක් විය.

## 2.8 වාහන උපයෝජනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත්, දිස්ත්‍රික්ක තුනට අදාල වාහන අනතුරු අතුරින් 2011 දෙසැම්බර් 31 දින වන විට අවසන් ක්‍රියාමාර්ග නොගත් වාහන අනතුරු සංඛ්‍යාව 116 ක් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

- වාහන 18 ක් සම්බන්ධව ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කර නොතිබූ අතර, සුනාමියට විනාශවී ගොස් තිබූ වාහන 10 ක් සම්බන්ධයෙන් අවසන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- වාහන 28 ක් සම්බන්ධයෙන් අලාභ තක්සේරු කිරීමක් සිදුකර නොතිබූ අතර සමහර වාහන අනතුරට පත්වී වසර 18 කට වැඩි බවද නිරීක්ෂණය විය.

(ආ) මාතර නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 04 ක් නිශ්ක්‍රීයව පැවති අතර ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එමෙන්ම කාර්යාලයට අයත් ගිලන් රථයක් 2009 අප්‍රේල් මස 11 දින ද තවත් ගිලන් රථයක් 2010 අගෝස්තු මස 04 දින ද අනතුරකට පත්වී තිබුණි. එම රථ අළුත්වැඩියාවන් සඳහා පිළිවෙළින් රු.137,736 ක් හා රු.133,045 ක් වැයකර තිබූ අතර ඒ සඳහා රක්ෂණ හිමිකම ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම අනතුරට පත් කැබ් රථ දෙකක් හා ගිලන් රථයක් සඳහා මුදල් රෙගුලාසි 104 (4) අනුව පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) බලපිටිය රෝහලට අයත් වාහනයක් 2008 ජූලි 18 දින අනතුරට ලක්වී තිබූ අනතුරෙහි තක්සේරු පිරිවැය රු.658,183 ක් විය. අදාල වාහනය රක්ෂණය කර නොතිබීම නිසා අනතුරෙන් සිදුවූ අලාභය අයකර ගැනීමට, නොහැකිවී තිබුණි. එමෙන්ම 2011 මාර්තු 24 දින අළුත්වැඩියාට යොදවා තිබූ අදාල රථය 2011 දෙසැම්බර් දක්වා අළුත්වැඩියා කර නැවත ලබාගෙන නොතිබුණි.

(ඈ) ප්‍රධාන ලේකම් කාර්යාලයට අනුයුක්ත වාහන දෙකක් 2010 වසරේ පෙබරවාරි හා මාර්තු මාසවල හදිසි අනතුරකට භාජනයවී තිබුණි. එම වාහන දෙකට සදුවූ අලාභ හානියේ වටිනාකම රු.1,426,900 ක් පමණ විය. නමුත් මෙම වාහන දෙකට සිදුවූ මෙම අනතුරු සම්බන්ධ මූලික පරීක්ෂණයන් 2011 දෙසැම්බර් 31 වන විටත් පවත්වා නොතිබුණ අතර, පළාත් සභා මුදල් රීති 54.4 ප්‍රකාරව ප්‍රාරම්භක හෝ පූර්ණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. එක් වාහනයක් සඳහා රක්ෂණ වන්දි ලෙස රු.319,477 ක් ලැබී තිබූ අතර, අනෙක් වාහනයේ රක්ෂණ වන්දි ගෙවීම සඳහා අළුත්වැඩියා වියදම් වලට අදාල මුල් බිල්පත් එවන ලෙස 2011 ජුනි 23 දින රක්ෂණ සමාගමෙන් ඉල්ලීමක් කර තිබුණද, ඊටද කිසිදු ප්‍රතිචාරයක් 2011 දෙසැම්බර් 31 වන විටත් දක්වා නොතිබීම නිසා එම අනතුරින් සිදුවූ මුළු පාඩුව වන රු.1,049,680 සභා අරමුදලට වූ පාඩුවක් ලෙස නිරීක්ෂණය කෙරේ.

(ඉ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ 1998 සැප්තැම්බර් 14 දින අනතුරට පත් කැබ් රථයක් වෙනුවෙන් රක්ෂණ වන්දි ලබාගැනීමට වගකිව යුතු නිලධාරීන් නියමිත කාලය තුල කටයුතු නොකිරීම නිසා පූර්ණ වන්දි මුදල ලෙස රක්ෂණ ආයතනය තක්සේරු කරන ලද රු.300,000 ක මුදල ලබාගැනීමටද නොහැකි වී තිබුණි. මෙම වාහනය අළුත්වැඩියා නොකර 2011 ඔක්තෝබර් විගණන අවස්ථාව දක්වා වර්ෂ 13 ක් තිස්සේ උඩුකාව යාන්ත්‍රික අංශයේ ගාල් කර තිබුණි.

(ඊ) (i) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් ) කාර්යාලයට අයත් කැබ්රථයක් 2009 අප්‍රේල් 10 දින හා 2010 අප්‍රේල් 11 දින හදිසි අනතුරු වලට ලක්වී තිබුණද, ඒ පිළිබඳව විධිමත් පරිදි ක්‍රියාකර නොතිබුණි.

(ii) මෙම අනතුරු ආවරණය වන පරිදි 2011 ඔක්තෝබර් 16 දින මිල ගණන් කැඳවා වාහනය රු.1,652,000 ට අළුත්වැඩියා කර තිබූ අතර, ඒ සඳහා රක්ෂණ වන්දි ලබාගෙන නොතිබුණි.

(උ) දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය දකුණු පළාත් මුදල් රීති 422.1 (ආ) පරිදි සැපයුම් හා සේවා සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවීමෙන් පසුව ප්‍රසම්පාදන කටයුතු සිදුකල යුතු වුවත්, මෝටර් රථයක් සඳහා රු.2,376,916 ක වටිනාකමින් යුත් අළුත්වැඩියා වියදම් දැරීමේදී, අවස්ථා පහකදී අළුත්වැඩියාවෙන් පසුව ටෙන්ඩර් අනුමැතිය ලබාගෙන ඇති බව නිරීක්ෂණයවූ අතර, අනුමත නොවන ආයතනයකින් අළුත්වැඩියා සිදුකර තිබුණි.

## 2.9 හඳුනාගත් පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණයවූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) නෙළුව ග්‍රාමීය රෝහල සතු දෙමහල් ගොඩනැගිල්ල වටා ඇති පැති බැම්ම හානිවීමේ තත්ත්වයක් මත 2008 වර්ෂයේ සිට අතහැර දමා තිබූ අතර, 2012 මාර්තු විගණන අවස්ථාව වන විට,

(i). එම ගොඩනැගිල්ලේ තිබූ ඖෂධ, ශල්‍ය උපකරණ ආදී සියළු දේවල් අත්හැර දමා තිබුණි.

(ii). 1999 - 2009 වර්ෂය දක්වා කල් ඉකුත්වූ ඖෂධ ප්‍රමාණයක් තිබූ අතර, ඒවා භෞතිකව පරීක්ෂා කිරීමට නොහැකි තරම් විශාල තොගයක් විය.

(iii). කල් ඉකුත්වීමට ආසන්න ඖෂධ සම්බන්ධව අනුගමනය කළයුතු ක්‍රියාපිළිවෙල අනුගමනය කර ඒවා අපහරණය කර නොතිබුණි.

(iv). විගණන අවස්ථාව වන විට මේවා විනාශ කිරීමට කමිටුවක් පත්කර තිබූ අතර, එහිදී අනුගමනය කලයුතු විධිමත් ක්‍රියා පිළිවෙලක් සකසා නොතිබුණි.

(v). මෙම ඖෂධ වලින් කොටසක රෝහල් භූමියේ නිල නිවසක සඟවා තිබුණි.

(vi). වර්ෂ 10 ක පමණ කාලයක සිට නිලධාරීන් මාරුවන අවස්ථාවලදී ඉන්වෙන්ට්‍රි භාණ්ඩ භාරදීමේ හා භාරගැනීමේ විධිමත් වැඩ පිළිවෙලක්ද ක්‍රියාත්මකවී නොතිබුණි. වර්ෂ ගණනාවක සිට තොග ලේඛන තුලනය කර නොතිබුණි.

(ආ) බෙලිඅත්ත ආයුර්වේද රෝහලේ ඖෂධ නිෂ්පාදනාගාරයේ ඇත ඖෂධ තොග පිළිබඳ කරන ලද භෞතික පරීක්ෂාවේදී ඖෂධ කිලෝ ග්‍රෑම් 133.855 ක ඌණතාවයක් මෙන්ම ඖෂධ කි.ග්‍රෑම් 17.97 ක අතිරික්තයක්ද අනාවරණය විය. තවද ඌණතාවයේ වටිනාකම රු.37,877 කට ආසන්න විය. එලෙසම වියලි ඖෂධ කි.ග්‍රෑම් 6007 ක් අනුමත මිලට වඩා වැඩි මිලකට මිලදී ගැනීම නිසා ආයුර්වේද දෙපාර්තමේන්තුවට සිදුවූ මූල්‍යමය පාඩුව රු.654,784 ක් වුවද, මේ පිළිබඳ කිසිදු ක්‍රියාමාර්ගයක් රෝහල් බලධාරීන් විසින් ගෙන නොතිබුණි.

(ඇ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් හුංගම කලමැටිය මාර්ගයේ 2008 ජූලි 25 දින ඉදිකරන ලද බෝක්කුව නිසි ප්‍රමිතියට අනුව ඉදි නොකිරීම හා නියමිත ප්‍රමිතියට කම්බි යෙදීම සිදුනොකිරීම නිසා සම්පූර්ණයෙන් පුපුරා ගොස් ඇති බව රසායනාගාර ඉංජිනේරුවරයෙකු විසින් තහවුරු කර ඇතත්, මෙමගින් අධිකාරියට වූ මූල්‍ය අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ අදාල නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට 2011 දෙසැම්බර් 31 දින දක්වා ක්‍රියාකර නොතිබුණි. මේ සඳහා විගණන දිනය වූ 2009 නොවැම්බර් 18 දිනට රු.2,551,998 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඈ) ආයතන සංග්‍රහයේ xxxiii වන පරිච්ජේදයේ 7.1 වගන්තිය ප්‍රකාරව ලබාගත් විධිමත් අනුමැතියකින් තොරව දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව නිලධාරීන් විසින් පවරන ලද නඩු අදාල නිලධාරීන් විසින් පසුව ඉල්ලා අස්කර ගෙන තිබූ අතර මෙම නඩු සඳහා අධිකාරිය විසින් දරන ලද රු.1,278,000 ක නඩු ගාස්තු අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(ඉ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2006 වර්ෂයේදී රු.9,660,000 ක් වැය කර මිලට ගෙන තිබූ තාර ස්ප්‍රේ යන්ත්‍රය 2011 ඔක්තෝබර් දක්වා දකුණු පළාතේ කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා භාවිතා කර නොතිබුණි. අවස්ථා දෙකකදී බස්නාහිර පළාත් සභාව වෙත කුලී පදනම මත මෙම යන්ත්‍රය ලබාදී රු.2,489,401 ක බිල් නිකුත් කර ඇතත්, 2011 ඔක්තෝබර් 17 වූ විගණන දිනය දක්වා ඉන් අයවී තිබුණේ රු.914,465 ක් පමණි. මෙම යන්ත්‍රය සඳහා අධිකාරිය අළුත්වැඩියාවන්, රක්ෂණය හා ක්ෂය වෙනුවෙන් 2011 ඔක්තෝබර් දක්වා රු.4,082,401 ක් වැය කර තිබූ අතර, මේ අනුව මේ දක්වා අධිකාරියට මෙම යන්ත්‍රය මගින් සිදුවූ අලාභය රු.3,167,936 ක් විය.

(ඊ) කාර්මික සංවර්ධන අධිකාරිය විසින් පැවැත්වූ 2011 "බෙන්තා වෙළෙඳ සැණකෙළිය" වෙනුවෙන් ආදායම් වශයෙන් රු.499,780 ක් ලැබී තිබුණද, වියදම් වශයෙන් රු.2,460,114 ක් දරා තිබුණි. මේ අනුව කාර්මික සංවර්ධන අධිකාරියට රු. 1,960,334 ක පාඩුවක් සිදුවී තිබුණි.

(උ) 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව පොද්දල වඩු සේවා මධ්‍යස්ථානයේ ශුද්ධ අලාභය රු. 969,338 ක් වූ අතර, මීරියාගොඩ රතු මැටි නිමවුම් සහ ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ අලාභය රු. 204,598 ක් විය. මෙම මධ්‍යස්ථාන දෙකෙහිම අලෙවි ප්‍රවර්ධනය සඳහා ප්‍රමාණවත් අලෙවි සැලැස්මක් නොතිබුණි.

## 2.10 දූෂ්‍ය වංචනික ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1979 අප්‍රේල් 02 දින දිසත්‍රික් සේවා උපගුරුවරියක ලෙස ගුරු සේවයට බැඳී තිබූ ගුරු මහත්මියකගේ උපන් දිනය වෙනස් කර 2005 නොවැම්බර් 14 දින සිට 2008 පෙබරවාරි 12 දක්වා වසර දෙකයි මාස තුනක් පමණ කාලයක් වංචා සහගත ලෙස ගුරු සේවයේ රැඳී සිට වැටුප් වශයෙන් රු. 459,448 ක් ලබාගෙන තිබුණි.

(ආ) වක්වැල්ල පුහුණු මධ්‍යස්ථානයට 2009 වර්ෂයේදී ලැබී තිබූ රු.65,298 ක මුදලක් එහි ස්ථාන භාර නිලධාරියා විසින් වංචා කර තිබූ අතර, 2012 මාර්තු 15 දින දක්වා ඒ සම්බන්ධව පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) මොරවක කලාප කාර්යාලයට අයත් මාර/ගින්නලිය මහා විද්‍යාලයට සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂය සඳහා හ/අඟුණුකොලපැලැස්ස කණිෂ්ඨ විද්‍යාලයේ සේවය කරන ලදැයි සඳහන් කරන ලද ගුරුවරයෙකු අනුයුක්ත කර ව්‍යාජ පත්වීම් ලිපියක් හා ව්‍යාජ වැටුප් විස්තරයක් පදනම් කරගෙන මෙම ගුරුවරයාට 2010 ජුනි මස සිට 2011 සැප්තැම්බර් මස දක්වා රු.297,120 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබූ අතර, ගෙවීම් කිරීමට පෙර පෞද්ගලික ලිපිගොනුව ගෙන්වා සනාථ කර නොගැනීම නිසා මෙම පාඩුව සිදුවී තිබුණි.

(ඇ) වලස්මුල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා 2009 දෙසැම්බර් 07 වන දින සිට 2009 දෙසැම්බර් 14 දින දක්වා සූකර උණ වැළඳී කරාපිටිය රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබාගෙන තිබුණද නේවාසික ප්‍රතිකාර ලැබූ 2009 දෙසැම්බර් 07, 08 හා 14 වන දින රාජකාරි කළ බවට ඉටුකළ වැඩසටහනෙහි සටහන් කර අසනීප නිවාඩු ලබාගෙන නොතිබුණි. තවද 2009 දෙසැම්බර් 09, 10 හා 11 දිනවල අසනීප නිවාඩු සඳහා ඉල්ලුම්පතක් දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබුණේ 2010 ඔක්තෝබර් 25 දින වූ අතර විගණන දිනය වූ 2012 මාර්තු 28 දින වන විටත් අදාල බලධාරියා විසින් නිවාඩු අනුමත කර නොතිබුණි.

(ඉ) වලස්මුල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක 2010 මාර්තු 12 දින සිට 2010 දෙසැම්බර් 19 වන දින දක්වා නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන යටතේ පැවැත්වූ ඉංග්‍රීසි පුහුණු පාඨමාලාවේ අධීක්ෂණ කටයුතු සිදුකල බවට දින 89 ක් සඳහා රු. 26,000 ක මුදලක් ලබාගෙන තිබූ අතර එම දීමනා ලබාගත් දින 25 ක් සඳහා වෙනත් රාජකාරි ඉටුකළ බවට ගමන් වියදම් හා නිවාඩු දින වැටුප් වශයෙන් රු. 19,314 ක්ද ලබාගෙන තිබුණි.

## 2.11 ආර්ථික නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වට්ටක්ගොඩ ආයුර්වේද රෝහල නවීකරණය කර නේවාසික රෝහලක් බවට පත්කිරීමට 2003 වසරේදී තීරණය කර තිබුණි. එහි මුල් පියවර ලෙස ජල සැපයුම ලබාදීම සඳහා නල ලිඳක් ඉදිකිරීමට තීරණය වී තිබූ අතර, එම නල ලිඳ ඉදිකිරීමට ජල සම්පාදන මණ්ඩලය දී තිබූ උපදෙස් නිසි පරිදි නොපිළි පැදීම නිසා ජලය ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබුණි. ඒ වෙනුවෙන් වැයකල රු.427,413 ක මුදල නිෂ්ඵල වී තිබුණි.

(ආ) තිස්ස ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට අයත් මාමඩල මල්පෙත්තාව මාර්ගයේ කිලෝ මීටර් 5 ක් ප්‍රොබේස් තාක්ෂණය යටතේ නවීකරණය කර තිබුණි. මෙහි නඩත්තු කාලය 2009 ජනවාරි 10 සිට 2012 ජනවාරි 12 දක්වා විය. මේ සඳහා 2009 ඔක්තෝබර් 27 වන විට රු.11,753,880 ක් ගෙවා තබුණි. මෙම මාර්ගය අදාල කොන්ත්‍රාත්කරු විසින් නිසිලෙස නඩත්තු නොකිරීම නිසා යොදන ලද පස් සම්පූර්ණයෙන් ඉවත්කර නැවත ඒබීසී යොදා නවීකරණය කිරීම සඳහා 2010 නොවැම්බර් 01 දින මාර්ග ජාල 4 ක් යටතේ රු.69,461,470 කට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. මෙම තත්ත්වය තුල ප්‍රොබේස් තාක්ෂණය යටතේ මාර්ගය ඉදිකිරීමට දරන ලද සම්පූර්ණ මුදල නිශ්ඵල වී තිබුණි.

(ඇ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2011 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ 2011 වර්ෂයේ ඉදි කරන ලද පහත විස්තර කරන ලද මාර්ග අවසන් කිරීමකින් තොරව නතර කර තිබූ බැවින් අදාල මාර්ග වෙනුවෙන් දරන ලද රු.28,764,613 ක මුදල විනාශ වීමට ඉඩහැර තිබුණි.

| මාර්ගය | කළවැඩ වටිනාකම | අවසාන කල දිනය |
|---|---|---|
| | රු. | |
| බමුණුගම බෝගහ සිනිවැල්ල මුල | 15,133,574 | 2011.11.07 |
| වැල්ලේතොට කිතලගම මාර්ගය | 3,333,117 | 2012.02.14 |
| කිවුල පිංගම මාර්ගය | 10,297,921 | - |

(ඈ) නියෝජ්‍ය ලේකම් කර්මාන්ත කාර්යාලයේ වැල්ලමඩම කර්මාන්ත සහකාර ලේකම් කාර්යාලයේ පැතිබැම්ම ඉදිකිරීමේදී ඇස්තමේන්තු කරන ලද කොන්ක්‍රීට් ලේසරය නොදැමීම, අත්තිවාරමේ ඇස්තමේන්තු කර තිබූ ගැඹුර භෞතිකව නොතිබීම නිසි පිරිවිතරයන්ට අනුකුල පරිදි සිමෙන්ති වැලිබදාම මිශ්‍රණ භාවිතා නොකිරීමත්, පැතිබැම්ම පුපුරා තිබූ ආකාරයටත් අනුව ඉදිකිරීම වෙනුවෙන් දරා තිබූ රු.1,503,500 ක වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ඉ)(i) කෝදාගොඩ දික්කුඹුර මාර්ගය නවීකරණය සඳහා 2007 වර්ෂයේදී රු.7,368,281 කට ඇස්තමේන්තු කර තිබුණු අතර, නැවත 2009 වර්ෂයේදී රු.6,762,540 කට ඇස්තමේන්තු කර තිබුණි. වරින් වර අමතර ඇස්තමේන්තු අනුමත කිරීම හා මාර්ගයේ කොටස් නැවත ඇස්තමේන්තු කර පැවරීම මත රු.12,335,253 ක කල වැඩ වටිනාකමක් සඳහා රු.11,877,189 ක් ගෙවා තිබුණි. මෙය 2009 ඇස්තමේන්තු අගය 82% කින් ඉක්මවීමක් වීය.

(ii) මාර්ගයේ කි.මී. 0+500 - 1+438 දක්වා කොටස නවීකරණය වෙනුවෙන් රු.2,523,186 ක කල වැඩ සහතික කර රු.2,065,122 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.මාර්ගයේ දෙවන වර තාර යෙදීම සිදුනොකිරීම නිසා නවීකරණය කරන ලද මාර්ගය සම්පූර්ණයෙන් විනාශවී තිබුණි. මෙම තතත්වය මත ගෙවන ලද සම්පූර්ණ මුදල නිශ්ඵලවී තිබුණි.

(iii) 2011 ඔක්තෝබර් 21 විගණන දිනය වන විට මෙම මාර්ගය නැවත නවීකරණය කිරීමට ඇස්තමේන්තු සකසා තිබුණු අතර මෙහිදී සම්පූර්ණ මාර්ගය සඳහා ABC අතුරා නැවත සකස් කර කාපට් කිරීමට සැලසුම්කර තිබුණි. මේ තත්ත්වය තුල මෙම මාර්ගයේ කි.මී.0+525 - 1+500 හා 1+625 - 1+940 දක්වාවූ කොටස ප්‍රොබේස් තාක්ෂණය යටතේ නවීකරණය සඳහා දරන ලද සම්පූර්ණ මුදල හා ඉහත ඡේදයන්හි දැක්වෙන පරිදි දරන ලද රු.11,877,189 ක සම්පූර්ණ වියදම නිශ්ඵල වියදමක් බවට පත්වී තිබුණි.

## 2.12 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2011 නෙවැම්බර් මස 11 දින සිට 25 දින දක්වා මෙක්සිකෝ නුවර පැවැත්වුන ජාත්‍යන්තර සමුපකාර සංවිධානයේ වාර්ෂික මහා සම්මේලනයට සහභාගිවීම වෙනුවෙන් නිලධාරීන් තිදෙනෙකු සඳහා සමුපකාර අමාත්‍යාංශයෙන් රු. 1,210,492 ක මුදලක් 2011 නොවැම්බර් 08 දින ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ ගිණුමට බැරකර තිබුණි. මෙම විදේශ සංචාරය සඳහා සමුපකාර අමාත්‍යාංශයට අදාල නොවන නිලධාරීන් වෙනුවෙන් රු.403,497 ක් වැය කර ඇතත් එය ප්‍රතිපූරණය කර ගෙන නොතිබුණි.

## 2.13 අවිධිමත් ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) (i) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ 2010 දෙසැම්බර් 01 හා 15 දින අධි සේවක පදනම මත 10 ශ්‍රේණියට බඳවාගත් රියදුරන් දෙදෙනෙකු බඳවාගත් දින සිට විෂය භාර අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයට අනුයුක්ත කර දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් වැටුප් ගෙවා තිබුණි. 2011 නොවැම්බර් 30 දිනට මෙම දෙදෙනා වෙනුවෙන් වැටුප් ලෙස රු.448,854 ක් අධිකාරය විසින් වැයකර තිබූ අතර අධිකාරියේ කිසිදු රාජකාරියක් ඔවුන්ගෙන් ඉටුවී නොතිබුණ. අදාල අමාත්‍යවරයාගේ වැය ශීර්ෂයෙන් මෙම මුදල් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ii) 2010 දෙසැම්බර් 02 දින වෙක්රෝල් පදනම මත බඳවාගත් කම්කරුවෙකු විෂයභාර අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයට අනුයුක්ත කර 2011 දෙසැම්බර් 31 දින දක්වා රු.214,705 ක් අධිකාරිය විසන් වැටුප් ලෙස ගෙවා තිබුණි. අදාල අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයට අමතරව බඳවා ගෙන ඇති මෙම සේවකයාගේ වැටුප් අදාල අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ආ) 2011 වර්ෂය තුල දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රයෝජනයට නොගෙන විෂයභාර අමාත්‍යවරයාට සහ පළාත් මාර්ග ව්‍යාපෘතියට යොදවා තිබූ අධිකාරිය සතු වාහන තුනක් වෙනුවෙන් අධිකාරිය විසින් අළුත්වැඩියා හා නඩත්තු වියදම් ලෙස රු.1,341,861 ක මුදලක් දරා තිබුණි.

(ඇ) 2009 දෙසැම්බර් 08 දින හා 2010 පෙබරවාරි 13 දිනැති මැතිවරණ කොමසාරිස්වරයාගේ ලිපි පරිදි මැතිවරණ කටයුතු සඳහා රජයේ සම්පත් අනිසි ලෙස භාවිතා නොකල යුතු බව දක්වා ඇතත් දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් අනුමත ඉන්ධන ප්‍රමාණයට වඩා ඩීසල් ලීටර් 5350 ක් හා පෙට්‍රල් ලීටර් 380 ක් මැතිවරණ කටයුතු සඳහා 2010 වර්ෂය තුලදී භාවිතා කර ඇති අතර එහි දළ වටිනාකම රු.165,160 ක් විය.

(ඈ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2011 දෙසැම්බර් මස 20 දින රු.967,253 ක මුදලක් යොදවා මත්ස්‍ය දැල් වර්ග තුනක් මිලදී ගැනීමේදී අදාල ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිපැද නොතිබුණි.

2.14 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) **වත්කම් බැරකම් ලේඛණය**

----------------------------

(i) 2011 දෙසැම්බර් 31 දිනට වත්කම් හා බැරකම් පකාශයේ ජංගම වත්කම් යටතේ දක්ෂිණ සංවර්ධන අධිකාරියට නිකුත් කල ණය ලෙස දක්වා තිබූ රු.5,614,079 ක ශේෂය වසර ගණනාවක් තිස්සේ පවතින ශේෂයක් වන අතර, එය මෙතෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2011 දෙසැම්බර් 31 දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශයේ දක්වා ඇති රු.2,667,947 ක් වූ ශේෂයන් නිරවුල් නොකර වසර ගණනාවක් තිස්සේ පවතින ශේෂයන් බැව් නිරීක්ෂණය විය.

(iii) 2009 වසරේ සිට දිගින් දිගටම ඌණතාවයක් පැවතීම නිසා දකුණු පළාත් සභා අරමුදල ක්‍රමයෙන් අඩුවෙමින් පවතින බව නිරීක්ෂණය විය. 2009 ජනවාරි 01 දිනට රු.829,911,570 ක් ව පැවති පළාත් අරමුදල් ශේෂය 2011 දෙසැම්බර් 31 දින වන විට රු.249,484,108 දක්වා 70% කින් අඩුවී තිබුණි.

(ආ) නැවුංගල හා පිටිගල ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලා පිහිටි ඉඩම් ආයුර්වේද දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අනියම් සේවකයින් 15 දෙනෙකු වෙනුවෙන් වර්ෂ දෙකක් තුල ගෙවිය යුතු රු.611,902 ක් හා 12% ක සේව්‍ය පක්ෂයේ දායක මුදල අර්ථ සාධක දායක අරමුදල වෙත යවා නොතිබුණි.

(ඈ) ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් , වියලි කලාපීය උද්භිද උද්‍යානයේ සංවර්ධන කටයුතු සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් යන්ත්‍ර සූත්‍ර ලබාදීම වෙනුවෙන් 2010 මැයි සිට සැප්තැම්බර් දක්වා අධිකාරියට ලැබිය යුතු රු.587,117 ක් 2011 දෙසැම්බර් දක්වා ලැබී නොතිබුණි.

(ඉ) 2010 වසරේදී වාහන මිලදී ගැනීම සඳහා රු.52,500,000 ක මුදලක් ප්‍රධාන ලේකම් කාර්යාලයට වෙන්කර ගෙන තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වාහන මිලට ගැනිම සඳහා වැයකර තිබුණේ රු.2,824,050 ක් පමණි. ඉතිරි මුදල වන රු.49,675,950 ක 2011 ජූලි මාසය වන තෙක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඊ) දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය සතු වක්වැල්ල කළමනාකරණ පුහුණු ආයතනය පිහිටි අක්කර 3 1/2 පමණ වූ බිම් කොටසේ අයිතිය ප්‍රධාන ලේකම් සතු නොවුවද, එහි සංවර්ධන කටයුතු වෙනුවෙන් ගොඩනැගිලි ඉදිකිරීම් ඇතුළු සියළු වියදම් ආරම්භයේ සිටම ප්‍රධාන ලේකම් වැය ශීර්ෂයෙන් දරා තිබුණි.

(උ) ලුණම රණවිරු ගම්මානයේ අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2010 දකුණු පළාත් සභා උපමාන පාදක ප්‍රදාන යටතේ රු. 364,650 ක ගිවිසුම් වටිනාකමට ලුණම උතුර ග්‍රාම සංවර්ධන සමිතියට පවරා කොන්ත්‍රාත්කාර සමිතිය වෙත රු. 264,632 ක් ගෙවා තිබුණි. මේ පිළිබඳ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූයේ කිලෝමීටරයක් පමණ දුරට යොදා තිබූ බොරළු ප්‍රමිතියෙන් තොර මඩ සහිත ඒවා බවය.

(ඌ) දකුණු පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය, ගාල්ල දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය හා මාතර දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය පවත්වා ගෙනයාම සඳහා ස්ථිර ගොඩනැගිලි නොමැතිවීම නිසා 2011 වර්ෂය සඳහා පමණක් රු.996,000 ක මුදල ගොඩනැගිලි කුලී වශයෙන් පෞද්ගලික අංශයට ගෙවා තිබුණි.

(එ) තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලය වෙත වෙන්කරන ලද ප්‍රතිපාදන වලින් වැටුප් ලබමින් වෙනත් ආයතන වෙත අනුයුක්ත කර තිබූ ගුරුවරුන් දෙදෙනෙකු වෙනුවෙන් 2011 වර්ෂයේ රු. 497,982 ක් ගෙවා තිබුණද ගෙවන ලද වැටුප් ප්‍රතිපූර්ණය කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) දිනකට සාමාන්‍යයෙන් නේවාසික ගැහැණු ළමුන් සංඛ්‍යාව 50 ක් ඉක්මවන කිතුලම්පිටිය සෙනෙහස ළමා නිවාසයේ ළමුන්ගේ ආරක්ෂාව පිළිබඳ දැඩි අවධානයක් යොමුකළ යුතු වුවද ආයතනයේ සේවා චකය පරීක්ෂා කිරීමේදී ඇතැම් සේවා මුරයන් සඳහා සේවයේ යොදවා ඇත්තේ කම්කරු සේවිකාවන් දෙදෙනකු පමණක් බව නිරීක්ෂණය වූ අතර 2011 වසර තුල ළමා නිවාසයෙන් ළමුන් 13 දෙනෙක් මිදී පළා ගොස් තිබූ අතර ළමුන් අසනීපවී රෝහල් ගතකල විටදී ආරක්ෂාව සඳහා නතර කිරීමට සේවකයින් නොමැති වීම හේතුවෙන් ළමුන් මිදීගිය අවස්ථා ඒ අතර විය. එමෙන්ම විනය පරීක්ෂණයකට යටත්ව හල්පාතොට නිවර්තන නිවාසයට මාරුකර යවා ඇති හිටපු මේට්‍රන්වරිය බලහත්කාර ලෙස ළමා නිවාසයේ නිල නිවාසය තුල තවදුරටත් රැඳී සිටීම නිසා වර්තමාන ස්ථානභාර මේට්‍රන්වරියගේ සේවය රාත්‍රී කාලයේදී නොලැබී යන බව පෙනේ.

(ඔ) හික්කඩුව සහතික කළ පාසලේ වඩු, විදුලි, ලෝහ හා පෙදරේරු යන වෘත්තිය අංශ පවතින අතර දැනට ක්‍රියාකාරීව පවතිනුයේ වඩු අංශය හා විදුලි අංශ පමණක් බව නිරීක්ෂණය වූ අතර පෙදරේරු අංශය ක්‍රියාතමකව නොමැතිසේම ලෝහ අංශය 2007 වසරේ සිට අක්‍රීයව පවතී. දැනට ක්‍රියාකාරී මට්ටමේ පවතින වඩු අංශයේ පුහුණුව ලබන ළමුන්ගේ වෘත්තිය හැකියාව නංවා ගැනීමට ප්‍රමාණවත් අමුද්‍රව්‍ය ලැබීමක් සිදු නොවන බවද නිරීක්ෂණය විය.

(ඕ) දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය මගින් බෙන්තොට ජනකලා කේන්ද්‍රයේ පවත්වා ගෙන යනු ලබන අලෙවි කුටි 10 න් අලෙවි කුටි 07 ක් වසා දමා තිබූ අතර, ඒ හේතුවෙන් රු.1,115,400 ක මුදලක් අධිකාරියට අහිමි වී තිබුණි. අලෙවි කුටි 04 ක් 2011 වර්ෂයට බදුදීම ප්‍රමාදවීම හේතුවෙන් අධිකාරියට රු. 178,200 ක බදුකුලී ආදායමක් අහිමි වී තිබුණි. තවද අදාල අලෙවි කුටි බදු කරුවන් සමග අධිකාරිය අත්සන් කරන ලද ගිවිසුම් පත්‍රයේ බදුකුලී ප්‍රමාද වන විට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ කිසිදු සටහනක් නොමැතිවීම නිසා බදුකරුවන් බදුකුලී ගෙවීම ප්‍රමාද කළද අධිකාරියට ගතහැකි ක්‍රියාමාර්ගයක් නොමැති බව නිරීක්ෂණය විය.

(ක) ක්‍රීඩා අරමුදල මගින් මිලදී ගන්නා ලද ක්‍රීඩා භාණ්ඩ භාරව සිටින වර්තමාන ගබඩා නිලධාරියා වෙත ඔහුට පෙර ගබඩාව භාරව සිටි නිලධාරියා විසින් භාර දෙන ලද ක්‍රීඩා භාණ්ඩ වර්ග 59කට අයත් ඒකක 902 ක ප්‍රමාණයක් හා සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද රු. 257,171 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ වර්ග 10කට අයත් ඒකක 369 ක් 2012 මැයි 14 දින දක්වා බෙදා දීමට කටයුතු කර නොතිබුණි.

(ග) දකුණු පළාත් සභාවේ 1990 අංක 01 දරන ක්‍රීඩා ප්‍රඥප්තියේ 24 වගන්තිය අනුව මෙම අරමුදලේ පරමාර්ථය වනුයේ දකුණු පළාතේ කඩා තරඟ වලට ධෛර්ය දීම හා ඒවා සංවර්ධනය කිරීම වේ. මෙම අරමුණ කරා ළඟාවීම වෙනුවෙන් මන්ත්‍රී ප්‍රතිපාදන වශයෙන් රු.7,554,232 ක මුදලක් ලැබී තිබුණු අතර වර්ෂය තුළ විදේශ ක්‍රීඩා තරඟ සඳහා සහභාගි වූවන්ට ආධාර වශයෙන් හා ක්‍රීඩා සමාජ සඳහා ආධාර ලබාදීම වෙනුවෙන් එයින් 37% ක ප්‍රමාණයක් වියදම් කර තිබුණි.

(ත) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත 2011 වර්ෂය තුළ සෞඛ්‍ය වැඩ සටහන් පැවැත්වීම වෙනුවෙන් ලබාදී තිබු රු.549,945 ක මුදලක් අදාල වර්ෂය තුළ වැඩ සටහන් නොපැවැත්වීම නිසා ආපසු යවා තිබුණි.

## 2.15 වත්කම් කළමනාකරණය

දකුණු පළාත් සභාවේ දකුණු පළාත් දුගී දුප්පත්කම දුරලීම සඳහා වන චක්‍රීය අරමුදලට ණය මුදල් ලබාදීම සඳහා ලැබී තිබූ මුදලින් රු.73,040,113 ක මුදලක් එම කාර්යය සඳහා උපයෝගී කර නොගෙන ප්‍රධාන ලේකම් වෙත යවා තිබුණි. මෙම මුදල ස්ථාවර තැන්පතුවල ආයොජනය කර තිබූ අතර, 2011 දෙසැම්බර් 31 දිනට පොලිය සමඟ මුළු වටිනාකම රු.86,632,387 ක් වූ අතර එය ඵලදායි ව්‍යාපෘතියක ආයෝජනය කර්මට කටයුතුකර නොතිබුණි.

## 2.16 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පසුගිය වර්ෂ 7 තුළ (2005 - 2011) දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - උපමාන පාදක ව්‍යාපෘති පිළිබඳ පරීක්ෂාවේදී නව ව්‍යාපෘති සඳහා නිදහස් කල රු.846,405,325 ක මුදලින් රු.520,485,023 ක් හෙවත් 61% ක් ද, අවිච්ඡේද වැඩ සඳහා නිදහස් කල රු.20,148,721 ක මුදලන් රු.16,330,840 ක් හෙවත් 81 % ක්ද වැය කර තිබුණි.

(ii) වර්ෂ 7 තුළ අනුමත කරතිබූ නව ව්‍යාපෘති 8357 න් ව්‍යාපෘති 2420 කද, අනුමත අවිච්ඡේද ව්‍යාපෘති 296 න් ව්‍යාපෘති 39 ක ද වැඩ ඒ ඒ වර්ෂවල දෙසැම්බර් 31 වන විට අරඹා නොතිබුණි.

(iii) එම කාලය තුළ අනුමත නව ව්‍යාපෘති 8357 න් ව්‍යාපෘති 2300 ක්ද, අවිච්ඡේද වැඩ 4499 න් වැඩ 19 කද , දෙසැම්බර් 31 දිනට වැඩ නිමකර නොතිබුණි.

(iv) දකුණු පළාත් දුගී දුප්පත්කම දුරලීම සඳහා වන චක්‍රීය අරමුදල යටතේ අවුරුදු 20 කට පමණ පෙර ලබාදී තිබූ ආපසු ගෙවීමේ කාලය වසර 3 ක් වන ණය මුදලින් රු.38,126,464 ක මුදලක් මෙතෙක් අයකර ගෙන නොතිබුණි.

(v) 2011 දෙසැම්බර් 31 දිනට ශිෂ්‍ය සංඛ්‍යාව 50 ට අඩු පාසැල් තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලය තුළ 13 ක් ද, වලස්මුල්ල කලාපය තුළ 10 ක් ද, හම්බන්තොට කලාපය තුළ 10 ක් ද තිබුණි.

## 2.16.1 රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනයන් සහ වැය කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රතිපාදනය | වියදම | |
|---|---|---|---|
| | රු. | රු. | |
| උපමාන පාදක ප්‍රදාන | 292,000,000 | 691,650,457 | පසුගිය වර්ෂ වල ඉතිරි මුදල් වැයකර ඇත |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1,207,500,000 | 1,264,289,000 | |
| සාමහික ප්‍රදාන | 11,759,940,000 | 14,402,060,964 | |
| වෙනත් ප්‍රදාන | 145,171,685 | 187,346,726 | |

## 2.16.2 පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා වු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ යටතේ රු.1,644,671,088 ක අගයකට වු වැඩ යෝජනා 4,874 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනා වල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා ගණන |
|---|---|---|---|
| (අ) සම්පූර්ණ නිමකළ | 3566 | 245 | 3811 |
| (ආ) 50% කට වඩා අඩුවෙන් නිමකළ | 897 | 24 | 921 |
| (ඇ) ආරම්භ කර නොතිබූ | 411 | 05 | 416 |
| එකතුව | 4874 | 274 | 5148 |

## 2.17 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

2.17.1 උඩුගම දිසා රෝහලේ ශල්‍යාගාරය ඉදිකිරීම සඳහා රු.6,800,000 ක මුදලක් ලෝක බැංකු ආධාර යටතේ වෙන්කර තිබූ අතර, කර්මාන්තයේ ආරම්භක දිනය 2010 ජුලි 08 දින විය. අවසාන දිනය 2010 නොවැම්බර් 06 දින විය. මේ පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අදාල කර්මාන්තයේ වැඩ වර්ෂයක් ප්‍රමාදවී 2011 ජුලි 26 දින නිමකර තිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට බිල්පත්‍රය අනුව නිමකල වැඩ වටිනාකම රු.5,468,843 ක් වු අතර, 2010 දෙසැම්බර් මස ගාල්ල දිස්ත්‍රික් ඉංජිනේරු විසින් අනුමැතියට ඉදිරිපත් කල වාර්තාව අනුව කල වැඩ වටිනාකම රු.6,533,367 ක් විය. මින් බිල්පත් අනුව අමතර හා බාහිර වැඩ වටිනාකම රු.1,939,147 ක් වු අතර, දිස්ත්‍රික් ඉංජිනේරු අනුමැතිය ඉල්ලා තිබු ලිපිය අනුව අමතර හා බාහිර වැඩ වටිනාකම රු.2,606,446 ක් විය.

(ඇ) මෙම ඇස්තමේන්තම වරින් වර සංශෝධනය කිරීම නිසා රු.6,031,000 ක් වු ඇස්තමේන්තු මුදල රු.7,286,074 ක් දක්වා 20 % කින් වැඩිවී තිබුණි.

(ඈ) ශල්‍යාගාරය භෞතිකව පරීක්ෂාවේදී, ගොඩනැගිල්ලේ බිත්ති පුපුරා, බිත්ති උළු (Wall tile ) 07 ක් පුපුරා ගොස් තිබු බවත්, වායු සමීකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි පරිදි දොරවල් වල හිදැස් හා වෙනත් අඩුපාඩු ඇති බවත්, F -2 වැය විෂය යටතේ යෙදවීමට යෝජිත අහල් 6 x 4 තලාදය වෙනුවට 6 x 3 යකඩ තලාද යොදා තිබු බවත්, වහලේ කුමේර බැඳීමේදී එය විධිමත් පරිදි ඉටු නොකිරීම නිසා වැසි ජලය කාන්දුවීම වැලැක්වීමට වහල මුදුනට ඉටිකොල යොදා වසා තිබු බවත්, නිරීක්ෂණය විය.

(ඉ) අතිරේක වැඩ විෂය අංක EX - 4 යටතේ සවිකර ඇති ඇම්පියර් 63 බෙදාහැරීමේ පුවරුවේ වටිනාකම වු රු.145,710 ක මුදල සැඳුම්ලත් ආකාරය පැහැදිලි නොවිය.

2.17.2 බෙලිඅත්ත ආයුර්වේද රෝහලේ ඖෂධ නිෂ්පාදනාගාරයේ අර්ෂ්ඨ අංශයේ ගොඩනැගිල්ල පුළුල් කිරීමේ කර්මාන්තය රු.1,183,883 ක වටිනාකමකට ඉදිකිරීම් ආයතනයක් වෙත පවරාදී තිබුණි. මේ අනුව පොලව සිමෙන්ති දැමීම ඔවුන් විසින් සිදුකර තිබු නමුත්, එය පුපුරා යෑම නිසා දෙවන වරටද පොලව සිමෙන්ති කර තිබුණි. දෙවන වරද කරන ලද එම කාර්යය පිළිබඳ 2011 නොවැම්බර් 17 සිදුකල භෞතික පරීක්ෂාවේදී අනාවරණය වුයේ පොලව නැවත පිපිරීම් සිදුව ඇති බවයි. .

2.17.3 තංගල්ල ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලයට අයත් නිහිලුව - ඕකෙවෙල මාර්ගයේ කි.මී.3+375 - 3 + 441 කොටස නවීකරණය කිරීම, සඳහා රු.549,481 ක ගිවිසුමට එළඹ තිබුණි. කර්මාන්තය 2010 නොවැම්බර් 01 දිනෙන් පටන් ගෙන 2011 පෙබරවාරි 28 දිනෙන් අවසන් කිරීමට නියමිතව තිබුණි. සැලසුමට අනව නියමිත ඝණකමින් මාර්ගය ඉදිකර නොතිබු බව 2011 දෙසැම්බර් 09 දින මාර්ගය පරීක්ෂාවේදී අනාවරණය විය.ඒ අනුව කොන්තාත්කරුට රු.32,487 ක මුදලක් වැඩිපුර ගෙවා තිබු අතර, නියමිත ප්‍රමිතියට මාර්ගය ඉදිකර නොතිබීම නිසා එහි දිගුකාලින පැවැත්මද අවිනිශ්චිතය.

2.17.4 (i) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කතලුව - තිත්තගල්ල මාර්ගය ඉදි කිරීමේදී කි.මී.0+000 - 5 +000 දක්වා කිලෝ මීටර් 5 ක් නවීකරණය කිරීම සඳහා රු.8,152,626 ක වැඩ ඇස්තමේන්තුවක් මත රු.7,118,474 කට කොන්ත්‍රාත්තුව පවරා තිබුණි. කර්මාන්තයේ ආරම්භක හා අවසාන දින 2009 සැප්තැම්බර් 24 හා 2010 ජනවාරි 22 විය. 2009 සැප්තැම්බර් 24 දිනට ප්‍රථම ගිවිසුම් අත්සන් කලයුතු වුවත් ගිවිසුම අත්සන් කර තිබුණේ 2009 දෙසැම්බර් 22 දිනයි. 2010 නොවැම්බර් 02 දක්වා අවස්ථා 8 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. 2011 ඔක්තෝබර් මස 21 විගණන දිනය දක්වා වැඩ අවසන් කිරීමේ සහතිකය නිකුත් කර නොතිබුණි.

(ii) මාර්ගයේ පාදම දුර්වල ස්ථාන ශක්තිමත් කිරීමේ අරමුණින් මාර්ගය නවීකරණය කිරීමට සැලසුම් කර, සැලසුම් පරිදි ගෙවීම් කර ඇතත්, ඉදිකිරීම් නියමිත සැලසුමට අනුව නිමකර නොතිබීම නිසා කොන්ත්‍රාත්කරුට ගෙවු රු.1,685,248 ක මුදල පිළිබඳ සෑහීමකට පත්විය නොහැක.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 අනුව කොන්ත්‍රාත් වටිනාකමින් 5% ක වටිනාකමකට සමාන කාර්ය සාධන බැඳුම්කරයක් ලබාගත යුතු වුවත්, මෙහිදී ලබාගෙන තිබුනේ කොන්ත්‍රාත් වටිනාකමින් 3 % ක කාර්ය සාධන බැඳුම්කරයකි.

## 3. **පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණයවූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා හා අදාල ආයතන ප්‍රධානින් දැනුවත් කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආයතන කටයුතු
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) සම්පත් උපයෝජනය
(ඉ) කොන්ත්‍රාත් පාලනය
(ඊ) වත්කම් කළමනාකරණය